# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
“பரிசர பியச”, 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
“Parisara Piyasa”, 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. **CEA/06/EPU/PR/37/2022**

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.

දිනය / திகதி / Date **2022.08.22**

## මාධ්‍ය නිවේදනය

### <u>මධ්‍යම පරිසර අධිකාරිය මහාපරිමාණ කිරිගව ගොවිපොළ පරිසර අධ්‍යයන වාර්තාවල ප්‍රගතිය විමසා බලයි....</u>

ශ්‍රී ලංකාව තුළ මහාපරිමාණ කිරිගව ගොවිපොළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළ හා සබැඳිව මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යභාරයට අදාළව ප්‍රගතිය විමසා බැලීම සඳහා අදාළ ව්‍යාපෘති යෝජකයන් සහ පාර්ශවකාර ආයතන සමඟ පසුගියදා මධ්‍යම පරිසර අධිකාරියේ දී රැස්වීමක් පැවැත්විය.

මහාපරිමාණ කිරි ගව ගොවිපොළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළ යටතේ කිරිගව ගොවිපොළ ඇතිකිරීමට සහ කිරිගවයින්ට අවශ්‍ය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට අදාළව ව්‍යාපෘති යෝජකයන් විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව ඔවුන් වෙතින් පරිසර අධ්‍යයන වාර්තා කැඳවා පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට යොමු කිරීම සහ පරිසර හිතකාමී ලෙස අදාළ ක්‍රියාවලිය පවත්වාගෙන යාමේ කටයුතු නියාමනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියා කරයි.

ව්‍යාපෘති යෝජකයන් හතරදෙනෙකු විසින් මහාපරිමාණ කිරිගව ගොවිපොළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලැබූව ද මෙතෙක් ඔවුන් මධ්‍යම පරිසර අධිකාරිය වෙත පරිසර අධ්‍යයන වාර්තා ඉදිරිපත් කර නැත. මෙම ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම සඳහා පරිසර අධිකාරිය පාර්ශවයෙන් රාජ්‍ය ආයතනයක් ලෙස යම් කිසි සහයක් අදාළ ව්‍යාපෘති යෝජකයන්ට අවශ්‍ය ද යන්න සහ ඔවුන්ට ඇති ගැටලු පිළිබඳ විමසා බැලීම සඳහා මෙම රැස්වීම පැවැත්විය.

මෙහිදී එක් එක් ව්‍යාපෘති යෝජකයින් විසින් තම පරිසර අධ්‍යයන වාර්තා සැකසීමේ ප්‍රගතිය පිළිබඳව ද මුහුණ දෙන ගැටලු පිළිබඳව ද කරුණු ඉදිරිපත් කරන ලදී. එලෙසම අදාළ කටයුතු සිදුකිරීමේ දී මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් ආයතනවලින් ලැබෙන සහයෝගය ද අගය කළ ව්‍යාපෘති යෝජකයෝ ඉදිරියට ද එම සහයෝගය අපේක්ෂා කරන බව ප්‍රකාශ කළෝය.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. අමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සාකච්ඡාවට මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා ඇතුළු නිලධාරීන් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය,


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **Chairman** | Tel : 2872361, 2872348 Fax : 2872347 | **Director General** | Tel : 2872359 Fax : 2872608 | **General Office** | Tel : 2872278, 2873447, 2872419, 7877277-280 | **Complaint** : 2888999 Emergency Hot Line : 1981 |
| **D.D.G** | **HRD. Admin. & Finance** Tel : 2865296 Fax: 2877515 | **Envt. Pollution Control** Tel : 2873453 Fax : 2872605 | **Envt. Mgt. & Assess.** Tel : 2872388 Fax: 2872296 | **Envt. Edu. & Awareness** Tel : 2872297 Fax : 2872609 | **Waste Mgt.** Te. 2872409 Fax: 2882152 | **Regional Oper.** Tel : 2872370 |

වයඹ පළාත් පරිසර අධිකාරිය යන ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ද ඇක්සස් ඇග්‍රෝ පුද්ගලික සමාගම, ගම්පොල හෙයා පාක් ඩේරිස් පුද්ගලික සමාගම, ගලහ හිල්සයිඩ් ඇග්‍රො පුද්ගලික සමාගම, නාවලපිටිය රූබි ඩේරි ෆාම් පුද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ව්‍යාපෘති යෝජක ආයතන නියෝජිතයන් ද සහභාගි විය.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිළධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස් අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය